
# ආඩම්බර ජිරාෆ්ට පාඩමක්



බිනුලි යෙහන්සා විජේසුන්දර

# ආඩම්බර ජීරාෆ්ට පාඩමක්

බිනුලි යෙහන්සා විජේසුන්දර


# ආඩම්බර පීරාෆ්ට පාඩමක්

කතෘ ප්‍රකාශනයකි

බිනුලි යෙහන්සා විජේසුන්දර

ISBN - 978 - 624 - 208- 563 - 0

ප්‍රකාශිත දිනය - 08.02.2025



# පිදුම

මෙම කෘතිය ලිවීමට

මට උදව් උපකාර කළ

මාගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට, ලොකු අම්මාට,

අත්තාට, අත්තම්මාට සහ

අක්කාටත්

නිරතුරුවම මා දිරිමත් කරමින්

යහමඟ පෙන්වන

ආදරණීය ගයානි ජයසුන්දර

ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් හා

ගෞරවයෙන් පුදමි

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය<br>
ශශිකලා සේනාධීර<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ආඩම්බර පීරාග්ට පාඩමක්

එකමත් එක කැලෑවක සත්තු ගොඩක් සතුටින් ජීවත් වුණා. එක දවසක් ඒ කැලෑවට අලුත් අමුත්තෙක් ආවා. ඒ තමයි පීරාෆ්.

පීරාෆ් එයාගේ  බෙල්ල දිග හින්දා  ගොඩක් ආඩම්බරයෙන් හිටියේ. "මට අනිත් අයට වඩා ගොඩක් දේවල් පේනවා". පීරාෆ් හිතුවා.

දවසක් කැලෑවේ යාළුවෝ

එකට හම්බවුණා. එතනට

පිරාෆ් ආවා. යාළුවෝ එයා

ළඟට ගියා.



“මාව ඔයාගේ යාළුවෙක් කර ගන්නවද?” සිංහයා ඇහුවා.

“හොඳයි, ඔයා කාටවත් බය නෑ. ඒ හින්දා මම ඔයාව මගේ යාළුවෙක් කර ගන්නම්” පීරාෆ් කිව්වා.

“මාවත් ඔයාගේ යාළුවෙක් කර ගන්නවා ද?” මොනරා ඇහුවා.

“හොඳයි, ඔයා ලස්සනයි. නටන්නත් පුළුවන්. ඒ හින්දා ඔයාව මගෙ යාළුවෙක් කර ගන්නම්” පීරාෆ් කිව්වා.

“මමත් ඔයාගේ යාළුවෙක් වෙන්න ද?” අලියා ඇහුවා.

“ඔයා ශක්තිමත්. ඒ නිසා මගේ යාළුවෙක් වෙන්න පුළුවන්” ජිරාෆ් කිවුවා.

“මටත් ඔයාගේ යාළුවෙක් වෙන්න ඕනේ” කුරුල්ලෙක් කිවුවා.

“හොඳයි, ඔයාට සිංදු කියන්න පුළුවන් නිසා මගේ යාළුවෙක් කරගන්නම්.” ජිරාෆ් කිවුවා.

එතකොට එතනට වඳුරු

පැටියෙක් ආවා.

"අනේ මාවත් ඔයාගේ යාළුවෙක්

කරගන්නවද ?" වඳුරු පැටියා

ඇහුවා.

ජිරාෆ් වඳුරු පැටියා දිහා

බැලුවා.

"අපෝ, ඔයා හරිම කැතයි. ඒ

නිසා ඔයාට මගේ යාළුවෙක්

වෙන්න බෑ" ජිරාෆ්

ආඩම්බරයෙන් කිවුවා.

වඳුරු පැටියාට හොඳටම දුක හිතුණා. එයා හයියෙන් අඬන්න පටන් ගත්තා.

"පුතේ, ඔයාටත් ලොකු ලොකු දේවල් කරන්න පුළුවන්" වඳුරු අම්මා ළඟට ඇවිත් කිවුවා.

එක දවසක් කැලේට ගින්දරක් ආවා. කැලේ හැමෝම ගින්දරෙන් බේරෙන්න වෙන පැත්තකට දුවගෙන ගියා.

පීරාෆ් දුවගෙන යනකොට එයාගේ දිග බෙල්ල උස ගහක අත්තක හිර වුණා. එයාට හොඳටම රිදුණා.



"අනේ, කවුරු හරි මාව බේරගන්න" පිරාෆ් කිවුවා. ඒත් අනිත් යාළුවෝ එයාව දාලා දුවලා ගියා.

පිරාෆ් හොඳටම බය වෙලා අඬන්න පටන් ගත්තා.

ඒක දැක්ක වඳුරු පැටියා ඉක්මණට ගහ දිගේ ගිහින් අත්ත අයින් කරලා පිරාෆ්ව බේර ගත්තා.

පිරාෆ්ට ලැජ්ජා හිතුණා. එයා වඳුරු පැටියාට ස්තුති කරලා සමාව ගත්තා.



ඒ දෙන්නා හොඳ යාළුවෝ වුණා.

ඊට පස්සේ ජිරාෆ් කවදාවත් ආඩම්බර වුණේ නෑ.

නිමි

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ  මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එලදායිතාව වෙනුවෙන් වසර  ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට  එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්